② වැනි කොටස : (I) වැනි ඡෙදය - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය - 2012.08.23

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1772/34 – 2012 අගෝස්තු 23 වැනි බ්‍රහස්පතින්දා – 2012.08.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේපත්තුව සුළු කොට්ඨාසයේ, රුක්මලේ (බටහිර) ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක සීඕ/එම්එච්ආර්/2009/654 හා 2010.07.08 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0041 ක් පමණ වූ ඉඩම් පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

1. **කැබලි අංක 01 – ඇටපන්විලකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0041ක් පමණ**

උතුරට: බී. එම්. රත්නසේකර හිමිකම් කියන ඇටපන්විලකුඹුර; නැගෙනහිරට: ලාල් වික්‍රමසිංහ හිමිකම් කියන කැකුණගහවත්ත සහ පි.පි.කො. 8832 හි කැබලි අංක 4; දකුණට: පි.පි.කො. 8832හි කැබලි අංක 5; බටහිරට: පි.පි.කො. 8832 හි කැබලි අංක 6 සහ බී. එම්. රත්නසේකර හිමිකම් කියන ඇටපන්විලකුඹුර.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: එල්ඩී/05/2008/ඕසීඑච්ඩබ්/422.
2012 ජූලි මස 10 වන දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09 - 211